<u>**බුදුදහමෙහි ඇසුර ලැබූ කෘෂිකර්මය.**</u>

ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස සැලකෙන ශ්‍රී ලංකාව අතීතයේ සිටම බුද්ධාගම පදනම් කරගත් කෘෂිකාර්මික සමාජයකට උරුම කම් කියන ඉතාමත් සුන්දර රටකි. බුදු දහම සහ කෘෂිකර්මාන්තය අතර ඇති සබඳතාවය බුද්ධ චරිතය තුළින් මනාව පැහැදිලි වෙයි. ඊට හොඳම උදාහරණය වන්නේ සුදොවුන් රජතුමාගේ දෙවැනි වැඳුම වප්මඟුල් උත්සවයකදී සිදුවීමයි. බුදුරජාණන් වහන්සේගේ නෑසියන් වූ ශාක්‍යයෝ ද අග්‍රගණයේ ගොවියෝ වූහ. සුද්ධෝදන රජුගේද අමිතෝදන, ධෝතෝදන, ශුක්ලෝදන ආදී රජුගේ සහෝදරයන් ගේ ද නම් කෙළවර වන්නේ "ඕදන" යන්නෙනි. "ඕදන" යනු බත්ය. මේ සියලු දෙනා බත් ප්‍රධාන ආහාරය කරගත් ගොවියන් වූ බව නිසැකය. එකල උත්සවශ්‍රීයෙන් සැමරූ වප්මඟුල් උත්සවයන්හිදී සුදොවුන් රජු ඇතුළු මහ ඇමතිවරු නඟුල් අතට ගෙන සීසෑම සිදුකර ඇත. කුඩා සිදුහත් කුමරු මෙන්ම කිරි මව්වරුන් පවා එම උත්සවය නැරඹීමට ගිය බව බුද්ධ චරිතයේ සඳහන් වේ.



කෘෂිකර්මාන්තයෙහි ප්‍රධාන අංගයක් ලෙස ශාක දැක්විය හැකිය. සෙවන, සිසිලස ලබා දීම, ආහාර ලබාදීම, දැව ලබා දීම ආදී ප්‍රයෝජන රැසක් ශාකයක් තුලින් ලබාගත හැකිය. බුදුරජාණන් වහන්සේට උත්තරීතර බුදු බව ලබා ගැනීමට උපකාරී වන්නේ ද ශාකයකි. අදටත් අපි මල් පහන්, සුවඳ දුම් පූජා කරන්නේ එම ශාකයක් වූ ඇසතු ශාකය හෙවත් ශ්‍රී මහා බෝධීන් වහන්සේටය.

ගෞතම බුදුපියාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි අවධියේදී ගොවියකුගේ කුඹුර සීසාන විට, වපුරන විට ආදී විවිධ අවස්ථාවලදී එහි වැඩම කොට කුඹුරේ තත්ත්වය පිළිබඳව විමසන්නට විය. එක් දිනක් මහා වර්ෂාවකින් මුළු කුඹුර විනාශ වූයේ ගොවියා දැඩිලෙස දුකට පත් කරමිනි. එවිට බුදුහිමි පැමිණ සියලු දේ අනිත්‍ය බව ගොවියාට පහදා දෙන්නට විය. එමෙන්ම සත්වයින්ට මුහුණ දීමට සිදුවන කුසල අකුසල විපාක පිළිබඳව දේශනා කරන ලද නියාම ධර්මයන්ගෙන් එකක් වන බීජ නියාමය සඳහාද කෘෂිකර්මය මූලික වී ඇත. මෙලෙස කෘෂිකර්මය උපයෝගී කරගෙන සත්ත්වයාට ධර්මාවබෝධය ලබාදීමට බුදුරජාණන් වහන්සේ උත්සාහ කර ඇත.



බුද්ධ කාලීන සමාජයේ තිබූ රැකියා අතරින් කෘෂිකර්මය ධාර්මික රැකියාවක් වශයෙන් බුදුරජුන් විසින් පිළිගෙන තිබේ. අවුරුදු දෙදහස් පන්සියයක් පමණ වූ දීර්ඝ ඉතිහාසය තුල කෘෂිකර්මය සිංහල බෞද්ධයන්ගේ ප්‍රධාන රැකියාව වී ඇත්තේ බුදු දහමේ බලපෑම නිසා විය යුතුය.

අතීතයේදී "ගමයි පන්සලයි වැවයි දාගැබයි" යන සංකල්පය මූලික කරගත් බුදු දහමේ ආභාෂය ලත් සුන්දර කෘෂිකාර්මික සමාජයක් පැවතුණි. දළදා වහන්සේ උදෙසා මෙන්ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා ද වාර්ෂිකව පැවැත්වෙන කිරි ආහාර පූජාව අතීතයේ පමණක් නොව අදටත් සිදුවෙමින් පවතින ආගමික චාරිත්‍රයකි. එමෙන්ම අලුත් සහල් මංගල්‍යය ද එවැනි චාරිත්‍රයකට කදිම නිදසුනකි. වෙහෙස මහන්සි වී



ලබාගන්නා අස්වැන්නේ පළමු කොටස වෙන් කොට තබා එය මහා සංඝරත්නය උදෙසා පූජා කිරීමේ සිරිතක් අතීතයේ ගොවියන් අතර විය.

සිංහල ගැමියෝ සිය නෑසියන් ට මහත් ආදරයක් හා ගෞරවයක් දැක්වූහ. ගොවිතැන් බත් කරමින් ජීවත් වූ ගැමියෝ මේ ගෞරවාදරය කියාපාන සිරිත් විරිත් සමූහයක්ම නිපදවා ගත්හ. ඔවුන් කටයුතු කළේ මුදලට නොව එකිනෙකා කෙරෙහි වූ ආදරයත් ගෞරවයත් නිසාය. පාරම්පරික ගමේ ගොවියන් උදව් උපකාර කොට ගත් ආකාරය මූලික වශයෙන් පස් වැදෑරුම් ය. මේ අතරින් පළමුවැන්න "අත්තමට වැඩ කරනවා" යනුවෙන් ද, දෙවැන්න "බුලතට වැඩ කරනවා" යනුවෙන් ද, තෙවැන්න "මුත්තෙට්ටුව වැඩ කරනවා" යනුවෙන්ද, සතරවැන්න "පේරුවට වැඩ කරනවා" යනුවෙන් ද හැඳින්වේ. මේ සියල්ලටම වඩා උතුම් කොට සලකන ලද්දේ පස්වෙනි ක්‍රමය වේ. එනම් පන්සලට අයත් කුඹුරේ වැඩ කර දීමයි. පින් තකා පන්සලට පූජා කරන ලද කුඹුරු හැම ගමකම පාහේ විය. මේ කුඹුරු හැඳින්වීමට "පින් කුඹුර", "පින් කනටිය" හෝ "පිංඅරාව" වැනි නම් යෙදිණි. මේ කුඹුරු අයත් වුණේ පන්සලට වුවත් හාමුදුරුවරුන්ට කුඹුරු වැඩ අකැප විය. එබැවින් ගමේ ගොවියෝ සියලු දෙනාම එක්වී පින් තකා මේ කුඹුරු වැඩ ඉටු කොට දුන්හ. පිනට වැඩ කිරීම තරම් උතුම් කටයුත්තක් ගමේ ගොවියාට නොතිබිණ.

ගොයම් කැපීමේදී වුවද ගොවියෝ ගොයම් කැපීමට පෙර ගොයම් අතර දෑකැති රඳවා ඊට වැඳ කටයුතු ආරම්භ කිරීම සිරිතකි. එමෙන්ම ගොයම් කපන විට කියන සමහර කවි වල පවා තුණුරුවන් සිහිපත් කොට ඇත.





රසායනික ද්‍රව්‍ය වලින් තොර කෘෂිකාර්මික පරිසරයක් ගොඩනැගීමට ලෝකයේ අවධානය යොමු වී තිබේ. එලෙස පළිබෝධ පාලනය කිරීම සඳහා කෙම් ක්‍රම, යාන්ත්‍රික ක්‍රම, ස්වභාවික ක්‍රම සහ ශාක සාර යොදාගත හැක. මේ සියල්ල එකට ගත් කළ එය "ඒකාබද්ධ පළිබෝධ පාලනය" ලෙස හැඳින්විය හැක. මෙහිදී පරිසර හිතකාමී සතුන් ආරක්ෂා වේ. බෞද්ධාගමික රටක් වශයෙන් මෙම පිළිවෙත් ඉතාමත් යහපත් ලෙස හඳුන්වා දීමට හැක. මේ සම්බන්ධව ගත හැකි හොඳම නිදසුන වන්නේ බොහෝ දෙනා තම වී වගාව විවිධ සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වගා ක්ෂේත්‍රයට පිරිත් පැන් ඉසීමයි.

කෘෂිකර්මයට බුදුදහම සහ බෞද්ධ ප්‍රතිපත්ති යන දෙකම සමීප සබඳතාවයක් දක්වන බව ඉහත කරුණු අනුව මනාව පැහැදිලි වේ.

වෙත්මිණී සත්‍යා ගුණසේකර